# ප්‍රවෘත්ති නිවේදනය

## ජාතික පාරිභෝගික මිල දර්ශකය (පදනම 2013 = 100) : 2019 දෙසැම්බර්

## ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

## ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය

දුරකථනය: 011-2147414 ෆැක්ස්: 011-2877945 ඊමේල්: prices@statistics.gov.lk

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව මගින් ජාතික පාරිභෝගික මිල දර්ශකය මාසිකව නිකුත් කරනු ලබන අතර, 2019 දෙසැම්බර් මාසයේ ලක්ෂ්‍යාමය මතුපිට උද්ධමනය (Headline Inflation) 6.2%ක් බව එහි අධ්‍යක්ෂ ජනරාල් මෙම නිවේදනය නිකුත් කරමින් සඳහන් කර ඇත. පසුගිය නොවැම්බර් මාසයේ මතුපිට උද්ධමනය 4.1%ක් ලෙස වාර්තා විය. 2019 දෙසැම්බර් මාසයේ උද්ධමනය සඳහා ආහාර කාණ්ඩයේ 3.8%ක හා ආහාර නොවන කාණ්ඩයේ 2.4%ක දායකත්වයක් පිළිවෙලින් ලබා දී ඇත. එහෙත් 2018 නොවැම්බර් මාසයේ 0.4% ක්වූ මතුපිට උද්ධමනයට ආහාර කාණ්ඩයේ දායකත්වය -2.1%ක් හා ආහාර නොවන කාණ්ඩයේ දායකත්වය 2.5%ක් විය. 2018 දෙසැම්බර් මාසයට සාපේක්ෂව 2019 දෙසැම්බර් මාසයේ ආහාර කාණ්ඩයේ ප්‍රතිශතය වැඩිවීමට ප්‍රධාන වශයෙන් හේතු වූයේ සහල්, එළවළු, අළුත් මාළු, රතුළූණු සහ ලොකුළූණු යන ආහාර ද්‍රව්‍යවල පැවති ඉහළ මිල මට්ටම් ය.

ජාතික පාරිභෝගික මිල දර්ශකයේ මාසික වෙනස්වීම සංසන්දනය කලවිට, 2019 නොවැම්බර් මාසයේ 132.9ක් වූ දර්ශකාංකය 2019 දෙසැම්බර් මාසයේ 135.0ක් දක්වා ඉහළ යාමක් වාර්තා විය. පසුගිය මාසය හා සංසන්දනය කලවිට 2019 දෙසැම්බර් මාසයේ දර්ශකාංකය 2.1ක වැඩිවීමක් එනම් 1.6ක ප්‍රතිශතකාංක වැඩිවීමක් වාර්තා විය. මෙම මාසික වෙනස්වීමට ආහාර කාණ්ඩයේ දර්ශක අගය 1.82% කින් වැඩිවීම සහ ආහාර නොවන කාණ්ඩයේ දර්ශක අගය 0.25%කින් අඩුවීම දායක වී ඇත.

ආහාර කාණ්ඩය සැලකූවිට එළවළු, සහල්, රතුළූණු, පොල්, අළුත් මාළු, අර්තාපල්, පොල්තෙල්, මිරිස් කුඩු සහ පැපොල් යන ආහාර ද්‍රව්‍යවල මිල වැඩිවීමක් වාර්තා වී ඇත. එසේ වුවත් ලොකුළූණු, දෙහි, කෙසෙල් සහ අමු මිරිස් යන ආහාර ද්‍රව්‍යවල මිල අඩුවීමක් වාර්තා විය.

පසුගිය මාසය හා සංසන්දනය කලවිට, 2019 දෙසැම්බර් මාසයේ ආහාර නොවන කාණ්ඩයේ දර්ශක අගය අඩුවීම සඳහා 'සන්නිවේදන' (ස්ථාවර දුරකථන ගාස්තු, ජංගම දුරකථන ගාස්තු, විද්‍යුත් තැපැල්/අන්තර්ජාල ගාස්තු), 'විවිධ භාණ්ඩ හා සේවා' (වාහන රක්ෂණ ගාස්තු), 'නිවාස, ජලය, විදුලිය, ගෑස් හා වෙනත් ඉන්ධන' (ජල බිල්පත් හා නිවාස නඩත්තු/ප්‍රතිසංස්කරණ), 'සෞඛ්‍ය' (පෞද්ගලික රෝහල් කාමර ගාස්තු), 'විනෝදාත්මක හා සංස්කෘතික' (කේබල්/සැටලයිට් රූපවාහිණී ගාස්තු) සහ ගෘහ උපකරණ හා ගෘහ ඒකක නඩත්තු කටයුතු' යන කාණ්ඩවලට අයත් අයිතමයන්ගේ මිල අඩුවීම බලපා ඇත. කෙසේ වෙතත් පසුගිය මාසය හා සංසන්දනය කළවිට 'මධ්‍යසාර පාන වර්ග, දුම්කොළ හා මත්ද්‍රව්‍ය' (බියර් සහ බුලත්), 'ප්‍රවාහන' (ගුවන් ගමන් ගාස්තු) සහ 'රෙදිපිළි හා පාවහන්' යන කාණ්ඩවලට අයත් අයිතමයන්ගේ මිලෙහි වැඩිවීමක් වාර්තා වී ඇත. තවද පසුගිය මාසය හා සංසන්දනය කලවිට, 'අධ්‍යාපන' සහ 'ආපනශාලා සහ හෝටල්' යන කාණ්ඩවල මිල දර්ශක අගය වෙනසක් වී නොමැත. ආහාර නොවන කණ්ඩයේ දර්ශක අගය අඩුවීමට ප්‍රධාන හේතු වූයේ 2019 දෙසැම්බර් 01 දින සිට බලපැවැත්වෙන පරිදි එකතු කළ අගය මත බද්ද 15% සිට 8% දක්වා අඩු කිරීම, විදුලි සංදේශ බද්ද අඩු කිරීම සහ ජාතිය ගොඩනැගීමේ බද්ද ඉවත් කිරීමයි.

ජාතික පාරිභෝගික මිල දර්ශකයේ ලක්ෂ්‍යමය වෙනස්වීම් පදනම්ව නිතර මිල උච්චාවචනය වන ආහාර වර්ග, බලශක්ති සහ ප්‍රවාහන අයිතමයන් ඉවත් කිරීමෙන් පිළිඹිබු වන යටිදැරි උද්ධමනය (Core Inflation) 2019 නොවැම්බර් මාසයේ 5.5% සිට 2019 දෙසැම්බර් මාසයේ 5.2% දක්වා අඩුවීමක් වාර්තා විය.




**ජාතික පාරිභෝගික මිල දර්ශකයේ විචලනය (පදනම : 2013 = 100)**

| වර්ෂය | මාසය | දර්ශකාංකය | | දර්ශකාංකයේ මාසික වෙනස්වීම (%) | | ලක්ෂ්‍යමය උද්ධමනය (%) | |
|---|---|---|---|---|---|---|---|
| | | ජා.පා.මි.ද. (මතුපිට) | ජා.පා.මි.ද. (යටිදැරි) | ජා.පා.මි.ද. (මතුපිට) | ජා.පා.මි.ද. (යටිදැරි) | ජා.පා.මි.ද. (මතුපිට) | ජා.පා.මි.ද. (යටිදැරි) |
| **2018** | දෙසැ. | 127.1 | 127.6 | -0.5 | 0.0 | 0.4 | 3.1 |
| **2019** | ජන. | 127.3 | 130.2 | 0.2 | 2.0 | 1.2 | 5.1 |
| | පෙබ. | 126.7 | 131.3 | -0.5 | 0.8 | 2.4 | 5.5 |
| | මාර්තු | 126.4 | 131.8 | -0.2 | 0.4 | 2.9 | 5.8 |
| | අප්‍රේල් | 127.3 | 132.6 | 0.7 | 0.6 | 3.6 | 6.3 |
| | මැයි | 128.7 | 133.0 | 1.1 | 0.3 | 3.5 | 6.3 |
| | ජුනි | 129.2 | 133.0 | 0.4 | 0.0 | 2.1 | 6.1 |
| | ජූලි | 129.4 | 133.4 | 0.2 | 0.3 | 2.2 | 6.1 |
| | අගෝ. | 129.7 | 133.7 | 0.2 | 0.2 | 3.4 | 5.9 |
| | සැප්. | 130.6 | 134.0 | 0.7 | 0.2 | 5.0 | 5.6 |
| | ඔක්. | 131.9 | 134.4 | 1.0 | 0.3 | 5.6 | 5.6 |
| | නොවැ. | 132.9 | 134.6 | 0.8 | 0.1 | 4.1 | 5.5 |
| | දෙසැ. | 135.0 | 134.2 | 1.6 | -0.3 | 6.2 | 5.2 |